## 12. ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

## 12.1 විගණන විෂය පථය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 11 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 12.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**12.3 විගණන නිරීක්ෂණය**

---------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 12.4 සිට 12.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

-----------------------------------------------

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) අයවැය විචලනය**

---------------------

පහත සඳහන් විචලනයන් අනාවරණය විය.

(i) වැය විෂයයන් 01ක් සඳහා සළසා තිබුණු රු.50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 05 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම සහ සැලැසුම් කළ ක්‍රියාවලීන් ක්‍රියාත්මක නොවීම යන හේතූන් නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු රු.1,430,894 ක් වූ ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ

ප්‍රතිපාදනයෙන් සියයට 14 ත් සියයට 69 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) **අග්‍රිම ගිණුම්**

--------------

අග්‍රිම ගිණුමේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරක දී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය භාණ්ඩාගාර අනුමැතියෙන් රු.50,000 දක්වා වැඩි කරගෙන තිබුණු නමුත් එම සීමාවද ඉක්මවා නිලධාරීන් 04 දෙනෙකුට අවස්ථා 16 කදී රු.50,000 සිට රු.130,000 අතර එකතුව රු.998,500 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ii) කොමිෂන් සභාවේ රැස්වීම් හා වැඩමුළු ආදිය සඳහා සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 21 කදී ලබාදුන් එකතුව රු.638,000 ක් වූ අත්තිකාරම් වලින් රු.239,000 ක් හෙවත් සියයට 37 ක් උපයෝජනය නොකර නැවත පියවා තිබුණි. එසේම අත්තිකාරම් ලබාගත් කාර්යයෙන් බැහැරව වැය කිරීමද, ඇස්තමේන්තු ඉදිරිපත් කිරීමෙන් තොරව අත්තිකාරම් ලබාදීමද, එකම කාර්යය සඳහා ලබාගත් අත්තිකාරම් පියවීමට තවත් අත්තිකාරම් නිකුත් කරද තිබුණි.

## 12.4 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

-------------------------------------------

### 12.4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

-------------------------------

2013 වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබූ අතර එම සැලැස්මෙහි ඒ ඒ කාර්යභාරයන් ඉටුකළ යුතු කාලය හෝ කාලපරාසයද, ඇස්තමේන්තුගත පිරිවැය හා එක් එක් කාර්යයන් සඳහා වගකිව යුතු නිලධාරීන්ද සඳහන් කර නොතිබුණි.

### 12.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

---------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා රු.850,000 ක ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනිම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණි. එම සැලැස්මේ සඳහන් නොකළ එකතුව රු.805,256 ක් වැය

කර භාණ්ඩ මිලදී ගෙන තිබුණත්, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

**12.4.3 අභ්‍යන්තර විගණනය**
---------------------------

අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**12.4.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**
----------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කර නොතිබුණි.

**12.5 වත්කම් කළමනාකරණය**
-----------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**
--------------------------------------------

2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු පාවිච්චි කළ නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**12.6 අනුකූල නොවීම**
-------------------

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**
-------------------------------------------------------

නියැදි විගණන පරික්ෂණවලදී නිරික්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානයන්ට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 138 හා 245 (i) | 176,536 | ගෙවීම් වවුචර් 08 කින් කළ ගෙවීම් සහතික කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) මුදල් රෙගුලාසි 753 (1) (2) | භාණ්ඩ ලැබීමේදී හා නිකුත් කිරීමේදී භාණ්ඩ ලැබීම් ඇනවුම්පත් හා නිකුත් කිරීමේ ඇනවුම්පත් භාවිතා කර නොතිබුණි. |

## 12.7 කාර්යසාධනය

--------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ඉටු නොකළ කාර්යයන්**

**--------------------------**

සමාලෝචිත වර්ෂයේ ඉටුකිරීමට සැලැසුම් කළ පහත සඳහන් ක්‍රියාකාරකම් ඉටු කර නොතිබුණි.

(i) අනු ක්‍රියාකාරකම් 1 - සංවර්ධන යන්ත්‍රණය සඳහා සේවා උපදේශකවරු මාර්ගයෙන් පාසල්වලින් තොරතුරු එකතු කර ගැනීම. (Develop mechanism for collecting information from school system through in service Advisers)

(ii) අනු ක්‍රියාකාරකම් 3 - ජාතික විශ්ව විද්‍යාල සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම. ( preparation of policy proposals for development of national universities)

(iii) අනු ක්‍රියාකාරකම් 5 - විවිධ රටවල ප්‍රාථමික විෂය ධාරාව සහ ප්‍රාථමික අධ්‍යාපන අරමුණු අනුව සැසඳුම් වාර්තාව සකස් කිරීම. (preparation of comparison report on primary curriculum and primary education objectives in various countries)

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්**

**---------------------------------------------**

සමාලෝචිත වර්ෂයේ ඉටුකිරීමට සැලැසුම් කළ පහත සඳහන් ක්‍රියාකාරකම් ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි.

(i) අනු ක්‍රියාකාරකම් 2 – කුඩා පාසල් සංශෝධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම. (preparation of policy proposals and strategy for development of small schools) 2012 වර්ෂයේ සිටම ක්‍රියාත්මක වන මෙම ව්‍යාපෘතියේ පළාත් 09 න්ම තෝරාගත් පාසල්වලින් තොරතුරු එකතුකර කුඩා පාසල් සංවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා සකස් කිරිමට සැලැසුම්කර තිබූ නමුත් බස්නාහිර පළාත් පාසල්වලින් තොරතුරු එකතු කරගැනීම හැර වෙනත් කාර්යයක් සිදු කර නොතිබුණි.

(ii) අනු ක්‍රියාකාරකම් 4 – අධ්‍යාපන පද්ධතිය, කාර්යාල තුළ සිංහල භාෂාව භාවිතය සඳහා සන්නිවේදනය සහ මුද්‍රිත මාධ්‍ය ප්‍රමිති සකස් කිරීම. (preparation of standards communication and the printed media for Sinhala language usage in education system, official.) අදාල පාර්ශවයන්ගෙන් තොරතුරු එකතු කර, වාර්තාව සකස් කර තෝරාගත් පාසැල් වෙත බෙදාහැර, මත විමසුම් ලබාගෙන ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීමට සැලැසුම්කර තිබූ නමුත් සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය පිළිබඳ සාකච්ඡා වාර දෙකක් පැවැත්වීම හැර වෙනත් කාර්යයක් සිදුකර නොතිබුණි.

## 12.8 අවිධිමත් ගනුදෙනු

------------------------

කොමිෂන් සභාව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) වර්ග 08 කට අයත් එකතුව රු.335,450 ක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.8 (ඇ) මාර්ගෝපදේශයෙන් බැහැරව පිරිවිතරද ලබා නොගෙන සැපයුම්කරුවන් තෝරාගෙන එම මිලදී ගැනිම සිදු කර තිබුණි.

(ආ) හදිසි අවශ්‍යතාවයන් සේ සළකා ප්‍රසම්පාදන කමිටු අනුමැතියකින් හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශයකින් තොරව රු.386,500 ක් වටිනා ජංගම පරිගණක 03 ක් සහ එම්එස් වින්ඩෝස් ඔෆිස් පැකේජ 05 ක් මිලදීගෙන තිබුණි.

## 12.9 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 03 | - |
| (ii) | තෘතීයික මට්ටම | 11 | 04 | 07 |
| (iii) | ද්විතීයික මට්ටම | 10 | 09 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | | 36 | 28 | 08 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩුව පැවැති තනතුරු 08 ක් පිරවීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.